# 13-A කුමන්ත්‍රණ කල්ලිය සමඟ දයාන් ජයතිලක මහතා කොට උඩ යෑම

හදිසියේම දයාන් ට ඔහුගේ තනාපති රස්සාව නැතිවුනේ මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමාට වගේම බලයක් ඔහුටද තිබේයැයි සිතා මුලාවී දයාන් ක්‍රියා කිරීමය (delusion). වර්තරාජා, පාස්කරලිංගම් වැනි අය සමඟ සම්බන්ධ ඔහුගේ අතීත ක්‍රියාකලාපය දැන දැනත් ඔහුට වගකිවයුතු රාජ කාරියක් භාර දුන්නේ ඔහු කෙරෙහි යම් විශ්වාශයක් ඇතිවය. 13-A සම්බන්ධව ජනාධිපතිතුමා කඹයේ ඇවිදින කෙනෙකු මෙන් බලවත් දේශපාලන කඩු හරඹයක යෙදී සිටියදී දයාන් කළේ ජනාධිපතිතුමාව 13-A නමැති පඹ ගාලට කොටුකර ගැනීමට තැත් කිරීමය. නොයෙක් අවස්ථාවල ජනාධිපති කළ අදහස් දයාන් ට ඇසුණේ හා පෙනුණේ, 13-A, 13-A Plus, 13-A Classic යනාදී වශයෙන් පමණි. ඒ හැර ඔහු තවත් උපක්‍රමයක්ද තැත් කළේය. එය නම් ඔහු පත්තරවලට ලියන ලිපි ඔහුගේ පුද්ගලික අදහස් යැයි කියා පෑමය. මෙයත් ඔහු ඔහුවම මුළාකර ගැනීම්කි.

මහින්ද රාජපක්ෂ මහතා අවුරුදු 40 ක දේශපාලන අත්දැකීම් ඇති අයෙකි. ඔහුට මුහුණ පෑමට සිදුවූ ගැටලු හා ඔහු ඒවාට මුහුණ දී රට දෙකඩ වීමෙන් ගලවාගත් ආකාරය ලෝක ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙනවා නිසැකය. ජේ. ආර්. ගේ බුහුභූත විවස්ථාව ජනාධිපතිව හිරකාරයෙක් කර තිබුණි. ප්‍රභාකරන් ගේ හිර ගෙදරින් දැන් නිදහස් ව ඇතත්, මන්ත්‍රීවරුන් ගේ හිරගෙදරින් නිදහස් වීමට තවකාලයක් ගතවෙනු ඇත. හොරුන් හා මෝඩයින් මන්ත්‍රීවරුන් කරන චන්ද ක්‍රමය අහෝසිකර, මහජනයාට තම නියෝජිතයා තෝරා ගැනීමට ඉඩක් ලැබෙන තුරු ජේ.ආර්. ලංකාවට කල කොඩිවිනයේ විපාක විදීමට සිදුවනු ඇත. 2005 නොවැම්බර් වල ඔහුට විරුද්ධව වැඩ කල අයට ඇමති කම් දීමට මහින්දට සිදුවිය. " මේ යුද්ධය නම් කවදාවත් දිනන්නට බෑ," " ලංකාවේ පෙඩරල් රටක් ඇතිකළ යුතුය" කියා එදා බෙරිහන් දුන් අය දැන් ඇමති කම් ලබාගෙන 13-A ඇටවීමට ප්‍රසිද්ධියේම ක්‍රියාකරමින් සිටී. ඔවුන් ව රජයෙන් නෙරපා දැමීමට දැන්ම ඉඩක් ද නැත. මෙම ජාති ද්‍රෝහී පිරිසට හොරණෑවක් වීමට තිරණය කිරීම දයාන් ගේ තුන්වන මුළාවයි.

ලංකාවේ කලු සුද්දන්ගේ නායකයෙකුවන කාලෝ (සිංහලෙන් කරෝලිස්?) ෆොන්සේකා විසින් වර්තමාන හැරල්ඩ් ලැස්කි කියා හදුන්වා දී ඇති දයාන් ලංකාවට විශ්මය ජනක ප්‍රතිපල ලබාදී ඇතැයි සමහරු

හුවා දක්වති. මිනිසුන් මෙසේ පුම්බා දැක්වීම ලාංකික ජනයාගේ පුරුද්දකි. දයාන් සමග ක්‍රියාකළ අනිත් නිලධාරීන් ගැන කිසිදු සඳහනක් නැත. දයාන් කියනුයේ ඉන්දියාව-ඉන්දියාව කියන මන්තරයමය. දයාන් RAW සංවිධානයේ මිත්‍රයෙක් ද කියාද සිතේ. චීනය, රුසියාව ක්‍රියාකළ ආකාරය දයාන් ට නොපෙණේ. ඔහු මුළාවී ඇති බවට තවත් (හතරවෙනි) උදාහරණයකි මෙයත්. ඒ කෙසේ වෙතත් ගමෙන් ආ යුද භටයින් කල වීරෝදාර වික්‍රමය මුලු ලෝකයම අවදි කල බවද දයාන් ඉවතට විසිකර ඇත. තුන්වන ලෝකයේ රටවල් අද අවදි වී සිටී. බටහිර සුදු හම ඇති අය පරණ යටත් විජිත වලට දුන් හීනමානය (humiliation) අහෝසි වීමට ඉඩකඩ පෑදෙමින් පවතී.

ලංකාවේ ජනධිපති ලොවටම (ඉන්දියාවට පමණක් නොව) කියා ඇත්තේ දෙමළ ජනයාටත් අන් අයටත් 13-A ඉක්මවා යන බලය පැවරීමක් කරන්නට අදහස් කරණ බවය. මේ සඳහා මහජන අදහස ලබා ගතයුතු බවද ඔහු ලොවට ප්‍රජාතන්ත්‍රවාදය වපුරන්නට හතිලන සුදු හම ඇති අයටද පෙන්වාදී ඇත. මෙහිදී ප්‍රශ්නයක් ව ඇත්තේ බලය පවරන්නේ ජනයාටද (empowerment of people) නැත්නම් "දෙමළ රජවරුන්" වීමට බලා සිටින දැනට වෙස්මුහුණු දමාගෙන සිටින දෙමළ පෙඩරල් දේශපාලකයින්ටද (devolution of power) යන්නය. ලංකාවේ දෙමළ නිජ භූමියක් තිබේයැයි කියනතාක් දෙමළ දේශපාලකයින්ට බලය පැවරීම හසළක වීරයාගේ මව කළ පරිත්‍යාගය වතුරට දැම්මා වැනි ක්‍රියාවකි. දයාන් විසින් සඟවන කාරණාවක් නම් 13-A ගෙන ආවේ ලංකාවේ දෙමළ නිජභූමියක් තිබෙන බව පිළිගෙන එය ක්‍රියාවට නැඟීමට බවය.

දුප්පත් හින්දු දෙමළ ජනයා එළවා පසු පස ගිය නරියා මෙන් කොළඹ සිට ක්‍රියාකල ක්‍රිස්තියානි දෙමළ පොන්නම්බලම්-චෙල්වනායගම් ගේ ලණු කා සෑහෙන දුකකට පත්විය. ඉන් පසු ඔවුන් මුලදී කැමැත්තෙන් ප්‍රභාකරන් පසු පස ගියේය. ඔවුන්ගේ හතුරා ප්‍රභාකරන්ම බව දැනගැනීමට අහිංසක දෙමළ ජනයාට 2009 මැයි මාසය වනතුරුම සිටීමට සිදුවිය. බටහිර රටවල සිට ප්‍රභාකරන්ට සල්ලි එවූ අය ගේ තුවක්කු වලින් මියගියේ දෙමළ ජනයාමය. ඔවුන් ඉන් මුදවා ගත්තේ සිංහල යුද භටයින් විසිණි.

චන්ද පවත්වා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට දෙමළ ජනයාට ඉඩ ලබා දීම යුතුය. නමුත් කවුරු මොනවා කිවුවත් හුදෙක් භාෂාව මත පදනම් වූ භූමි මායිම් ඇතිකලහොත් නුදුරු අනාගතයේදීම තිම්පු ඉල්ලීම් හෝ ISGA or PTOMS මාදිලියේ ප්‍රෂ්ණ මතුවනවිට

ඒවාට උත්තර දීමට රජිතා සේනාරත්නලා, ඩිලාන් ලා, කරොලිස් ලා, ඩියු ගුනසේකර ලා හෝ තිස්ස විතාරන ලා මෙලොව නොසිටිනු ඇත. තමන්ට කියා දෙමළ රටක් සඳහා ලෝකයේත්, තමිල් නාඩුවේත් ඇති ව්‍යාපාරයට, පරණ යටත් විජිත වල කලබගෑනී ඇති කර හොද්ද බොරකර ගැනීමට කෙල හෙලමින් බලා සිටිනා අය උඩින් හා යටින් උඩගෙඩි දෙනබව නිසැකය.

චන්‍ද්‍රසිරි විජයවික්‍රම

මෙය ලියුවේ ජයන්ත අහංගම නිපදවූ ලතින් සිංහල අකුරු ක්‍රමයෙනි.